මාගේ අංකය-14/03/1/1 II වෙළුම,
නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය,
වාරිමාර්ග කළමණාකරන අංශය,
කන්තලේ මහා වාරිමාර්ග ව්‍යාපාරය,
කන්තලේ
2017/08/15

16 OCT 2017
MC-1
වාරිමාර්ග කළමනාකරණ අංශය

ව්‍යාපාර කළමණාකරන කමිටුවේ
සියළුම සමාජිකයන් මහත්ම/ මහත්මීන් වෙත යි

<u>ව්‍යාපාර කළමනාකරන කමිටුව 2017/08/15 පෙ.ව 9.30</u>
<u>නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව</u>

<u>ආගම් සිහි කිරීම</u>

සහභාගි වූ රාජ්‍ය නිළධාරින් =10
සහභාගි වූ ගොවි නියෝජිතයින් =26

<u>පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම -නේ.ව්‍යා.කළම.ණාකරු</u>

කමිටුව සඳහා සහාභාගි වූ වාරිමාර්ග ඉංජිනේරු ,ඉංජි.සහාකාරවරු ගොවි ජන සේවා නිළධාරින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරින් ඇතුළු සියළු රාජ්‍ය නිළධාරින් හා සියළුම ගොවි සංවිධාන නිලධාරීන් ඇතුළු සියළු දෙනා කමිටුව වෙනුවෙන් පිළිගන්නා ලදි.

විශේෂ ව්‍යාපාර කළමනාකරණ රුස්වීමක් කැඳවීමට හේතුව ලෙස 2017 යල කන්නය සඳහා වූ බෙත්ම වගාවෙ අනවසර වගාවන් පිළිබද සාකච්ජා කිරීමත් මෙම මස 24,25,යන දෙදින පැවැත්වීමට නියමිත සර්වඥ ධාතු ප්‍රදර්ශනය පිළිබද සාකාච්ජා කිරීමත් දක්වන ලදි.එසේම ගොවි සංවිධාන නිළධාරින්ගේ කටයුතු පිළිබද සාකච්ජා කල යුතු බව දක්වන ලදි.

<u>අග්බෝපුර ඩී 1-3 ගරු සභාපතිනි</u>

පසු ගිය දින කිහිපයේ පැවති වර්ෂාව නිසා ඇති වී තිබූ ජල ගැටළු අඩු වූ බවක් වගාවේ කිසිදු ගැටළුවක් නොමැති වූ බවක් දක්වන ලදි.එසේම මේ දින වල පවතින නියං ආධාර වැඩ සටහන පිලිබද කමන් හට අවබෝදයක් නොමැති බවක් විවිධ ජන මාධ්‍යාන් ඔස්සේ ඒ පිලබද සාකච්චා කරන අතර සියළු ගොවි සංවිධාන වලට මෙම ආධාර ලැබිය යුතු බැවින් ඒ පිළිබද වැඩි විස්තර සොයා බලන ලෙසත් දන්වන ලදි.

ඉදිරියේදි අග්බෝගම විහාරස්ථානයේ පැවැත්වීමට නියමිත සර්වඥ ධාතු ප්‍රදර්ශනය සඳහා සියළු ගොවි සංවිධානවල සහයෝගය ලබා දෙන ලෙස ද ඉල්ලා සිටින ලදි.

<u>නේවාසික ව්‍යාපාර කළමණාකරු</u>

අතීතයේ සිට පාරම්පරිකව පැවතෙන ප්‍රජා සත්කාර ඇදහිලි, චාරිත්‍ර වලට ගරු කළ යුතු බවක් ඒවා නැවත සමාජ ගතකළ යුතු බවක්පෙන්වා දෙන ලදි.පසුගිය දින වල කොවිලේ පැවති පූජාවන් නිසා වර්ශාව ලබා ගත හැකි වූ බව ගොවින්ගේ විශ්වාසය බවක් ආගම් බෙදයකින් තොරව එම කාර්ය සිදු කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

<u>රජ ඇල ඩී 05 ගොවි සංවිධාන ලේකම් මුතුගල මහතා</u>

රජඇල ඩී 5,යාය 5 ගොවි සංවිධාන බල ප්‍රදේශයන්හි නියං ආධාර ලබා දීමේ වැඩ සටහන පැවති බවත් එහිදී විවිධ ගැටළු සහාගත තත්වයන් ඇති වූ බවද ප්‍රකාශ කරන ලදී.විශේෂයෙන් යම් පවුලක එක් පුද්ගලයෙක් හෝ රාජ්‍ය සේවයේ නියුතු නම් එම පවුලට නියං ආධාර නොලැබෙන බවද දන්වා සිටින ලදී.

**වෙන්ද්‍රාසන්පුර ඩී 1-5 ගොවි සංවිධාන සභාපති**

තම ගොවි සංවිධාන බල ප්‍රදේශ තුළ තවමත් ගව ගැටළුව පවතින බවත් එහිදී ගවයකුන් අල්ලා දඩ මුදල් අය කර ගත් බවත් මේ වන විට පැවති වර්ෂා නිසා ජල ගැටළුව අවම වී ඇති බවත් දන්වන ලදී.නමුත් අලින්ගෙන් කරදර දිගටම ඇතිබව පෙන්වා දෙන ලදී.

රටට බත සපයන ගොවියා පිළිබඳ රජය අවධානය යොමු කළ යුතු බවත් මෙම නියං ආධාර සියළු ගොවි මහතුන් හට ලැබිය යුතු බවත් එම ආධාර ලබා දීමේදී වයෝවෘද්ධ ගොවි මහතුන්ගෙන් වැඩ නොගෙන යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම නියං ආධාර වැඩ සටහන ක්‍රියාත්මක වන්නේනම් එය ග්‍රාම නිළධාරි හරහා සිදුවිය යුතු බවත් ගොවි සංවිධානය මැදිහත් කර නොගත යුතු බවත් පවසන ලදී.

**වරාසිවිය ගොවි සංවිධාන සභාපති**

ජලය නිසි වේලාවට නොලැබීම නිසා අක් 2 2/1 ක පමන වගාව හානි වී ඇති බැවින් ඒ සඳහා වගා හානියක් ලබා දෙන ලෙස දන්වන ලදී.

**ජයන්තිපුර ගොවි සංවිධාන සභාපති**

තම යායේ වැලි සහිත බිම නිසා වගාවන් සඳහා වර්ශාව නොලැබුනෝත් දින 10ක් වත් ජලය අවශ්‍ය බව පවසන ලදී.

**අග්බෝපුර ඩී 8-9 ගොවි සංවිධාන සභාපති**

නියං අධාර වැඩ සටහන ගොවින්ගේ ඉල්ලීම් වලට ලැබුනු බවත් නමුත් එහි යම් යම් අඩු පාඩු පවතින බවත් ඒවා ඉක්මනින් නිවරදි කරගෙන ගොවින්ට එම ආධාර ලැබීය යුතු බවත් දන්වන ලදී .තවද ගොවි සංවිධානය තුළ සංවර්ධන වැඩ කටයුතු සිදු වන්නේනම් ඒ පිළිබඳ ගොවි සංවිධාන නිළධාරින් දැනුවත් කළ යුතු බවත් මේ වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයට මිලියන 5000ක් සංවර්ධන කටයුතු සඳහා ලැබී ඇති බවත් එම මුදලින් මිලියන 100ක් වත් කන්තලේ ව්‍යාපාරයේ ගොවි සංවිධාන වල සංවර්ධනය කටයුතු සඳහා ලබා දෙන ලෙස ජනාධිපතිතුමාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ඉංජිනේරු සහකාර**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සංවර්ධන කටයුතු සඳහා ලැබී ඇත්තේ මිලියන 2500ක් පමණ බවත් ඒ තුලින් 2017 වර්ෂය සඳහා කන්තලේ ව්‍යාපාරයට මිලියන 200ක් වෙන් වී ඇති බවත් දන්වන ලදී.

**ගන්තලාව ඩී 09 ගොවි සංවිධාන සභාපති**

තම යාය තුළ සංවර්ධන කටයුතු සිදු කලක් ගවයින් ඇතුළු වීම නිසා ඒවා විනාශ වන බව දන්වන ලදී.
කින්නියා කොටස ගව ගැටළුව බහුලව පවතින බවත් ඒ හේතුවෙන් සාරවල් විනාශ වී ඇති බව දන්වන ලදී.

**වාන් ඇල යාය 2 ගොවි සංවිධාන සභාපති**

තම ගොවි සංවිධාන බල ප්‍රදේශ වල ගව ගැටළුව හා අලි ගැටළුව බහුලව පවතින බව.

__පේරාරු ඩී 3-4ගොවි සංවිධාන සභාපති__

කම යාය තුලද ගව ගැටළුව දැඩිව පවතින බවත් ඒ පිළිබද පොලිසිය ඇතුළු අදාල රාජ්‍ය ආයතන වලට පැමිනිලි කළ බවත් නමුත් ගව හිමියන්ගෙන් පහර කෑමට ලක් වී බවත් දන්වන ලදී.

මෙම ගව ගැටළුව නිසා විශේෂයෙන් ගව ගාල් ඉදිකිරීම නිසා ගොවි සංවිධානයේ මුදල් වියදම් කර සැකසූ ඇළ මාර්ග සියල්ලම පාහේ විනාශ වී ඇති බවත් ගව ගාල් ඉවත් නොකරනුයේ මන්ද යන්න පිළිබද විමසන ලදී.එසේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කම ගොවි සංවිධානයට ගිය වර්ශයේ හා මෙම වර්ශයේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු වී නොමැති බවද දැනුම් දෙන ලදී .

__අග්බෝපුර ඩී 6 ගොවි සංවිධාන සභාපති__

ඩී ඇලේ වාරිමාර්ග රක්ෂිතය වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

__වරාකැලේ ගොවි සංවිධාන සභාපති__

සමස්ථයක් ලෙස සියළු ගොවි සංවිධාන විශාල ජල අර්බුදයක සිටින බවත් කඹලගමුව මහා කොවිලේ සිදු කළ පූජාවේ බලපෑමෙන් හෝ අවශ්‍ය අවස්ථාවේදී වර්ශව ඇද හැලුනු බවත් දන් වන ලදී .ගව ගැටළුවද සියළු ගොවීන්ට බලපෑ බවත් අදාළ රාජ්‍ය නිළධාරීන් මෙම ගටළුව විසදීම සදහා පියවර ගෙන නොමැති බවත් දන්වන ලදී.

ලංකාවේ සියළු මහා වාරි ව්‍යාපාර සදහා මහා කන්නයේ අනුරාධපුර ශ්‍රී මහා බෝදිය අසළ පූජාවන් පවත්වන බවත් එසේම යල් කන්නය සදහා යල් අස්වනු පූජාව ශ්‍රී දළදා මාලිගාවේ පැවැත් වන බවත් එහි ආශිර්වාදය ලැබෙන බවත් දන්වන ලදී.

මෙම වසරේ යල් අස්වනු පූජාව ඔක්තොම්බර් 1 දා සිදුවන බවත් ඊට සමගාමීව ලංකාවේ මහා වාරි ව්‍යාපාරවල සර්වඥ ධාතු ප්‍රදර්ශනය පවත්වන බවත් කන්තලේ ව්‍යාපාරයේ අගෝස්තු 24,25 යන දිනයන්හි අග්බෝගම ශ්‍රී මංගල වැව විහාරස්ථානයේදී පැවැත්වීමට කටයුතු යෝදා ඇති බවත් පෙන්වා දෙන ලදී.

__අග්බෝපුර ඩී 10 ගොවි සංවිධාන සභාපති__

සීනි කම්මල අසල ගිනි පෙට්ටි පාලම කොන්ක්‍රීට් කර සැකසිය යුතු බවත් බැරියල් එක අසල දොරවල් දිරාපත් වී ඇති බවත් එන මහා කන්නයට පෙර අලුත් වැඩියා කර දිය යුතු බවත් දන්වන ලදී.එසේම මේ වන විට කන්තලේ සීනි සමාගම 2017.08.16 වැඩ ඇරබීමට කටයුතු සුදානම් වී ඇති බවද මහාවැලි ජලය කන්තලේ වැව හරහා ලබා දීමට තීරනය කර ඇති බව කමිටුව දැනුම් දී ඇති බවත් එයට ගොවි මහතුන්ගේ කිසිදු කැමැත්තක් නැති බවත් රාජ්‍ය අංශයෙන් එම කටයුතු සදහා පූර්ණ අනුග්‍රහයක් දැක් වූ අතර කන්තලේ ගොවීන්ගේ වී වගාව සදහා ජලය ලබා දීමට එදා මෙදා තුර කිසිදු අනුග්‍රහයක් නොලැබෙන බවද දන්වා සිටීම්.

__නෝ.ව්‍යා. කළමණාකරු__

ඔක්තෝම්බර් 01 දින නුවර දළදා මාළිගාවේ පැවැත්වෙන සිරි දළදා යල් අස්වනු පූජාව සදහා සියළු දෙනාටම සහභාගී වන ලෙසත් අලුත් සහාල්,වී කරල් මිටි,ආදිය ගොවි සංවිධාන මගින් ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී.

__ඉංජිනේරු සහකාර -කන්තලේ__

අද වන විට ජලාශවල ධාරිතාවය

කන්තලේ අක්කර අඩි 21750

වෙන්ඩ්‍රසන්පුර අක්කර අඩි 675

වාන් ඇළ අක්කර අඩි 2362 බව දන්වන ලදී.

<u>නේවාසික ව්‍යාපාර කළමණාකරු</u>

වස විසෙන් තොර වගාව හා පාරම්පරික සිරිත් විරිත් හා පුද පූජාවන් අද වන විට ගිලිහී යමින් පවතින අතර ඒවා ආරක්ෂා කරගෙන ඉදිරි සමාජයට දායාද කළ යුතු බවත් ඒවා අනුව කන්තලේ මහා වාරිමාර්ග ව්‍යාපාරයේ අගසස් පූජාව හා සර්වඥ ධාතු වන්දනා වැඩසටහන අග්බෝගම විහාරස්ථානයේ පවත්වන බව දන්වන ලදී.ඒ සඳහා සුදුසු සංවිධායක කමිටුව පත් කර ගන්නා බව දැනුම් දෙන ලදී.පහත පරිදි කමිටුව පිහිටුවන ලදී.

1. ටී.එම්. හැරිසන් සිල්වා මයා (කමිටු සභාපති)
2. ජී. පී. /ගුණපාල මයා (අනුශාසක)
3. ආර්.එම් රනතුංග මයා
4. ඩබ්ලිව්.ඩී.එන්.දමයන්ති මිය( කමිටුවේ ලේකම්)
5. කේ. රම්‍යලතා මිය
6. ජානක ශ්‍රී ලාල් මයා
7. ආර්. එම් රත්නායක මයා
8. මහින්ද පාල මයා
9. මුතුගල මයා
10. සමන්ත බන්ඩාර මයා

කමිටු රැස්වීමේ අදාල කටයුතු ඉදිරියට කරගෙන යන හෙයින් තමන් මීට සම්පූර්ණ සහයෝගය දෙන ලදී.

<u>නේවාසික ව්‍යාපාර කළමණාකරු</u>

කමිටුව සඳහා සහභාගී වූ සියළු දෙනාට ස්තූතිය පුද කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

ජී.පී.සුනිල්
නේවාසික ව්‍යාපාර කළමණාකරු
වාරිමාර්ග කළමණාකරන අංශය
කන්තලේ මහා වාරිමාර්ග ව්‍යාපාරය

ජී.පී. සුනිල්
නේවාසික ව්‍යාපාර කළමණාකරු
කන්තලේ